# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2264/11 - 2022 ජනවාරි මස 26 වැනි බදාදා - 2022.01.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථාව - 7 වන සංශෝධනය

පහත I කොටසේ සඳහන් පරිදි සංශෝධිත, 2014 සැප්තැම්බර් මස 19 වැනි දින අංක 1880/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මෙහි පහත II කොටසේ දැක්වෙන පරිදි නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2022 ජනවාරි මස 19 වැනි දින.

I කොටස

| | |
|---|---|
| සංශෝධන අංක 01 | - 2016 ජූනි මස 15 වැනි දින හා අංක 1971/17 අති විශෙෂ ගැසට් පත්‍රය |
| සංශෝධන අංක 02 | - 2017 අගෝස්තු මස 17 වැනි දින හා අංක 2032/33 අති විශෙෂ ගැසට් පත්‍රය |
| සංශෝධන අංක 03 | - 2019 ඔක්තෝබර් මස 22 වැනි දින හා අංක 2146/22 අති විශෙෂ ගැසට් පත්‍රය |
| සංශෝධන අංක 04 | - 2020 පෙබරවාරි මස 10 වැනි දින හා අංක 2162/10 අති විශෙෂ ගැසට් පත්‍රය |
| සංශෝධන අංක 05 | - 2020 මාර්තු මස 03 වැනි දින හා අංක 2165/14 අති විශෙෂ ගැසට් පත්‍රය |
| සංශෝධන අංක 06 | - 2021 ජූනි මස 29 වැනි දින හා අංක 2234/12 අති විශෙෂ ගැසට් පත්‍රය |

II කොටස

**7.2.2.4.**

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මෙන්ම තම තනතුරේ භූමිකාව හා කාර්යභාරය හොඳින් ඉටුකිරීමට අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1A - G 35899 — 12 (2022/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**7.3.2.3. වෙනත් :**

iv. සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

**10. ශ්‍රේණි උසස් කිරීම :-**

10.1. *III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම*

10.1.1.1. සපුරාලිය යුතු අවශ්‍යතා

iv. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය - සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්කිරීමේ බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

10.2. *II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම*

10.2.1. සපුරාලිය යුතු සුදුසුකම්

iii. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

v. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පශ්චාත් උපාධි සුදුසුකම් තීරණය කරනු ලබන කමිටුව (6 වන පරිශිෂ්ඨය බලන්න) විසින් පිළිගනු ලබන එක් අවුරුදු විද්‍යාපති (M. Sc) හෝ ඒ හා සමාන සුදුසුකමක් හෝ ඊට ඉහළ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

10.2.2. උසස් කිරීමේ ක්‍රමය - සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්කිරීමේ බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3. *I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම*

10.3.1. සපුරාලිය යුතු සුදුසුකම්

v. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

* දැනට පවතින 6 වන පරිශිෂ්ටය ඉවත් කර පහත දැක්වෙන 6 වැනි පරිශිෂ්ටය ඇතුළත් කරනු ලැබේ.

**හයවැනි පරිශිෂ්ටය**

පශ්චාත් උපාධි සුදුසුකම් තීරණය කිරීමේ කමිටුවේ සංයුතිය -

1. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සභාපති)
2. කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු ඇතුළුව නියෝජිතයන් දෙදෙනෙක්

EOG 01-0254

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.